රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/1/ වක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date 2020.08.18

වක්‍රලේඛ අංක :- **08/2020**

සියළුම විවාහ, උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වන 1975 අංක 10 දරණ පනතේ විධිවිධාන සම්බන්ධයෙන් අවධාරණය කිරීම

විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2013.10.02 දිනැති වක්‍රලේඛ අංක 09/2013 ට අමතර වශයෙනි.

02. විවාහ ලියාපදිංචි කිරීමේදී, ඊට අදාළ සියළු ආකෘති පත්‍ර හා විවාහ ලේඛනය නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කර තිබිය යුතුවේ. නමුත් බොහෝ අවස්ථා වලදී රෙජිස්ට්‍රාර්වරුන් විසින් විවාහ ලේඛනයේ පිටපත් තුනම එකවර සම්පූර්ණ නොකර තෙවන පිටපත පමණක් සම්පූර්ණ කර අදාළ පාර්ශවයන් වෙත භාර දෙන බව මා වෙත වාර්තා වී ඇති අතර 2019.08.08 දි පැවති ප්‍රධාන ලේකම්/ දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන්ගේ සම්මන්ත්‍රණයේදී ද මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා විය.

03. මෙවැනි තත්ත්වයන් යටතේ විවාහ ලේඛනයේ පිටපත් තුනෙහි විවිධ වූ ලිඛිත දෝෂ හා වෙනත් වැරදීම් පැන නගින අතර, ඒ හේතුවෙන් විවාහ පාර්ශවයන් හට විශාල ගැටළු රාශියකට මුහුණ පෑමට සිදුවේ. එසේම එවැනි දෝෂ නිවැරදි කර ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග වෙත යොමුවිය යුතු බැවින් අමතර කාලයක් හා මුදලක් වැය කිරීමට ද ඔවුන් හට සිදුවේ. එබැවින් විවාහ ලියාපදිංචි කිරීමක දී අදාළ ආකෘති පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කිරීම මෙන්ම විවාහ ලේඛනයේ පිටපත් තුනම එකවර සම්පූර්ණ කිරීමට ක්‍රියා කළ යුතු බවත්, එම පිටපත් තුන පාර්ශවයන් වෙත පෙන්වා නිවැරදි බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඒ සඳහා පාර්ශවයන්ගේ අත්සන් ලබා ගැනීම හා ඔබගේ අත්සන යෙදීම සිදු කළයුතු බවත් මෙයින් දන්වා සිටිමි.

04. තවද මෙම උපදෙස් අනුව ක්‍රියා නොකරන්නේ නම්, අදාළ විවාහ රෙජිස්ට්‍රාර්වරයා කෙරෙහි විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවද එය රෙජිස්ට්‍රාර් ධුරය අවසන් කිරීම සඳහා හේතුවක් වන බවද වැඩි දුරටත් සඳහන් කරමි.

එන්.සී. විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්/ එන්. සී. විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත.

පිටපත්:
01. සියළුම දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.

02. සියළුම ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - නිරන්තර අධීක්ෂණයට සහ අ.කා.ස.

03. අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - නිරන්තර අධීක්ෂණයට සහ අ.කා.ස.

දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk, rg@rgd.gov.lk